දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය - රුහුණ විශ්වවිද්‍යාලය
Distance and Continuing Education Unit – University of Ruhuna

ශාස්ත්‍රවේදී සාමාන්‍ය (බාහිර) උපාධි ප්‍රථම භාග 2012 පරීක්ෂණය - 2015 ජනවාරි/පෙබරවාරි
Bachelor of Arts General (External) Degree Part I 2012 Examination – January/February 2015

# පාළි 2.2 - ව්‍යාකරණ හා අනිර්දිෂ්ට ග්‍රන්ථ
# PAG 2.2 - Grammar and Unspecified Texts

කාලය පැය තුන යි

පළමුවන කොටසේ ප්‍රශ්න සියල්ලටත් දෙවන කොටසින් ප්‍රශ්න දෙකකටත් පිළිතුරු සපයන්න.

---

## පළමුවන කොටස

01. සිංහලට පරිවර්තනය කරන්න.

5. අථ දුතියස්ස භික්ඛුනො එවමස්ස. "භගවා ඛො භුත්තාවී පවාරිතො පරිපුණ්ණො පරියොසිතො සුහිතො යාවදත්ථො. අත්ථි චායං භගවතො පිණ්ඩපාතො අතිරෙකධම්මො ඡඩ්ඩියධම්මො. සචෙ මයං න භුඤ්ජිස්සාම ඉදානි භගවා අප්පහරිතෙ වා ඡඩ්ඩෙස්සති අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙස්සති. යන්නූනාහං ඉමං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡා-දුබ්බල්‍යං පටිවිනෙත්වා එවං ඉමං රත්තින්දිවං වීතිනාමෙය්‍ය"න්ති. සො තං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡාදුබ්බල්‍යං පටිවිනෙත්වා එවං රත්තින්දිවං වීතිනාමෙය්‍ය. කිඤ්චාපි සො භික්ඛවෙ භික්ඛු තං පිණ්ඩපාතං භුඤ්ජිත්වා ජිඝච්ඡාදුබ්බල්‍යං පටිවිනෙත්වා එවං තං රත්තින්දිවං වීතිනාමෙය්‍ය, අථ ඛො අසුයෙව මෙ පුරිමො භික්ඛු පුජ්ජතරො ච පාසංසතරො ච. තං කිස්ස හෙතු: තං හි තස්ස භික්ඛවෙ භික්ඛුනො දීඝරත්තං අප්පිච්ඡතාය සන්තුට්ඨියා සල්ලෙඛාය සුභරතාය විරියාරම්භාය සංවත්තිස්සති. තස්මාතිහ භික්ඛවෙ ධම්මදායාදා භවථ මා ආමිසදායාදා. අත්ථි මෙ තුම්හෙසු අනුකම්පා: 'කින්ති මෙ සාවකා ධම්මදායාදා භවෙය්‍යුං, නො ආමිසදායාදා'ති.

(ලකුණු 20 යි)

(02) සිංහලට පරිවර්තනය කරන්න.

සුභාසිතෙනෙත අනුමෝදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි,
සීලං සිරිඤ්චාපි සතඤ්ච ධම්මං
පඤ්ඤඤ්ච තං සෙට්ඨතරං වදන්ති.

පඤ්ඤා හි සෙට්ඨා කුසලා වදන්ති
නක්ඛත්තරාජාරිව තාරකානං,
සීලං සිරිඤ්චාපි සතඤ්ච ධම්මො
අන්වායිකා පඤ්ඤවතො භවන්ති.

සුභාසිතෙනෙත අනුමෝදියාන
අඤ්ඤං තං පුච්ඡාමි තදිඞ්ඝ බ්‍රෑහි,
කථංකරො කින්තිකරො කිමාචරං
කිං සෙවමානො ලභතීධ පඤ්ඤං
පඤ්ඤායිදානි[1] පටිපදං වදෙහි
කථං කරො පඤ්ඤවා හොති මච්චො.

සෙවෙථ වුද්ධෙ නිපුණෙ බහුස්සුතෙ
උග්ගාහකො පරිපුච්ඡකො[2] සියා,
සුණෙය්‍ය සක්කච්ච[3] සුභාසිතානි
එවංකරො පඤ්ඤවා හොති මච්චො.

ස පඤ්ඤවා කාමගුණෙ අවෙක්ඛති
අනිච්චතො දුක්ඛතො රොගතො ච,
එවං විපස්සී පජහාති ඡන්දං
දුක්ඛෙසු කාමෙසු මහබ්භයෙසු.

(ලකුණු 20 යි)

(03) පාලියට පරිවර්තනය කරන්න.

බුදු රජහු හුනස්නෙන් නැගිට භික්සඟන පිරිවරා විහාරයට වැඩ භික්ෂූන් වත් දැක්වූ කල්හි ගඳකිළිය ඉදිරියෙහි වැඩසිට භික්සඟනට බුද්ධාවවාදය දී කමටහන් කියා දී භික්සඟන යවා මිහිරි සුවඳින් සුවඳවත් වූ ගඳ කිළියට පිවිස දකුණුපසින් සිංහ සෙය්‍යාවට පිවිසි සේක. ඉක්බිති, සවස් කාලයෙහි දම්සබාවෙහි භික්ෂූහු එහෙන් මෙහෙන් එක් රැස්ව රත්පැහැ කඩතුරාවකින් වටකරන්නාක් මෙන් වැඩහිඳ බුදුරදුන්ගේ ගුණ කියන්ට පටන් ගත්හ. ඇවැත්නි, මහාපන්ථක තෙරණුවෝ චුල්ලපන්ථකගේ අදහස් නොදැන සාරමසකින් එක් ගාථාවක් පාඩම් කිරීමට නොහැකි බාලයකු සේ සලකා විහාරයෙන් බැහැර කළහ. බුදු රජහු තමන් වහන්සේගේ අද්විතීය ධර්මාධිපත්‍යය නිසා එක් බතක් අතරතුර පිළිසිඹියා සහිත රහත් බව ලබාදුන්හ. පිළිසිඹියා සමග ම තුන්පිටකය ම අවබෝධ විය. අනේ, බුදුරදුන්ගේ බලයක මහත. බුදු රජහු භික්ෂූන්ගේ කථාව අසා මහණෙනි, මේ චුල්ලපන්ථක මා නිසා ධර්මයෙහි ධර්ම මහත්වයට පැමිණියෙහිය. පෙර මා නිසා ධනයෙහි ධන මහත්වයට පැමිණියේයැ යි වදාළහ. මහසඟන ඒ අර්ථය හෙළිකරන ලෙස අයදියහ. බුදු රජහු භවාන්තරයෙන් වැසුණු කරුණ ප්‍රකට කළහ.

(ලකුණු 20 යි)

## දෙවන කොටස

04. පාලි වර්ණමාලාවේ සම්ප්‍රදායාන්තර වෙනස්කම් දක්වා කච්චායන වර්ණ මාලාවේ ප්‍රභේද පෙන්වා දෙන්න.

05. පඤ්චමී විභක්තිය හඳුන්වා එහි විභක්ති ප්‍රයෝග සනිදර්ශනව පැහැදිලි කරන්න.

06. මනෝගණික ශබ්ද කවරේදැයි නම් කොට ඒවා වරනැඟීමේ දී දක්නට ලැබෙන විශේෂතා පෙන්වා දෙන්න.

07. සත්තමී අඛ්‍යාතය යෙදෙන විවිධ අවස්ථා උදාහරණ සහිතව පෙන්වා දෙන්න.

08. කිතක යන්න හඳුන්වා එහි ප්‍රභේද පෙන්වා දෙන්න.

ලකුණු 20 බැගින්

********************************